# වාණිජ විද්‍යාවේදී
# (Commerce)
# (BCOM)

## වාණිජ විද්‍යාවේදී (විශේෂ)
## බාහිර උපාධි පාඨමාලාව

# විෂය නිර්දේශය


දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය


www.cdce.kln.ac.lk

දෙවන මුද්‍රණය (සංශෝධිත) 2022

**ප්‍රකාශනය :**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*
*කැලණිය විශ්වවිද්‍යාලය*
*කැලණිය*

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ මුද්‍රණය කර විකිණීම සපුරා තහනම් වේ.*

# වාණිජ විද්‍යාවේදී (විශේෂ) බාහිර උපාධි පාඨමාලාව සඳහා විෂයය ඒකක

## පළමු ස්තරය

| | | |
|---|---|---|
| BCOM E1015 | කළමනාකරණ මූලධර්ම | හර |
| BCOM E1025 | සූක්ෂ්ම ආර්ථික විද්‍යාව | හර |
| BCOM E1035 | මූල්‍ය ගිණුම්කරණය | හර |
| BCOM E1045 | ව්‍යාපාර සඳහා ගණිතය | හර |
| BCOM E1055 | ව්‍යාපාර හා කාර්මික නීතිය | හර |
| BCOM E1065 | විද්‍යුත් වාණිජ්‍යය සහ තොරතුරු තාක්ෂණය හැඳින්වීම | හර |
| ELTU E1072 | *ව්‍යාපාර සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි | හර |

## දෙවන ස්තරය

| | | |
|---|---|---|
| BCOM E2015 | අලෙවි කළමනාකරණය | හර |
| BCOM E2025 | සංවිධාන චර්යා | හර |
| BCOM E2035 | ව්‍යාපාර සංඛ්‍යානය | හර |
| BCOM E2045 | පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය | හර |
| BCOM E2055 | සාර්ව ආර්ථික විද්‍යාව | හර |
| BCOM E2065 | සංකාර්ය කළමනාකරණය | හර |

## තෙවන ස්තරය

| | | |
|---|---|---|
| BCOM E3015 | මානව සම්පත් කළමනාකරණය | හර |
| BCOM E3025 | ව්‍යවසායකත්වය | හර |

| | | |
|---|---|---|
| BCOM E3035 | උසස් මූල්‍ය ගිණුම්කරණය | හර |
| BCOM E3045 | ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව | හර |
| BCOM E3055 | සංකාර්ය පර්යේෂණ | හර |
| BCOM E3063 | බදුකරණය | හර |
| BCOM E3072 | විගණනය සහ සහතික වීම | හර |

**සිව්වන ස්තරය**

| | | |
|---|---|---|
| BCOM E4015 | උපායමාර්ගික කළමණාකරණය | හර |
| BCOM E4025 | මූල්‍ය කළමනාකරණය | හර |
| BCOM E4032 | දැනුම් කළමනාකරණය | හර |
| BCOM E4033 | කළමනාකරණ තොරතුරු පද්ධති | හර |
| BCOM E4045 | සංවර්ධන ආර්ථික විද්‍යාව | හර |
| BCOM E4055 | පවුල් ව්‍යාපාර | හර |
| BCOM E4065 | ** ව්‍යාපාරික ප්‍රායෝගික පුහුණුව | **වෛකල්පික** |
| BCOM E4073 | ** ව්‍යාපෘති කළමනාකරණය | **වෛකල්පික** |
| BCOM E4082 | ** සංස්ථාපිත ආචාරධර්ම සහ යහපාලනය | **වෛකල්පික** |

* උපාධි ප්‍රදානය සඳහා ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA) අගය ගණනය කිරීම සඳහා
ELTU E1072 හි සම්භාර අගය එකතු නොවේ.

** සිසුන් විසින් වර්ෂයට අදාළ අධ්‍යයන සම්භාර ගණන සම්පූර්ණ කිරීම සඳහා ප්‍රායෝගික පුහුණුව හෝ විෂයන් දෙකක් තෝරා ගත යුතු ය. ව්‍යාපෘති කළමනාකරණය සහ සංස්ථාපිත ආචාරධර්ම හා යහපාලනය යන විෂය ඒකක තෝරා ගත යුතු ය.

**ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය :-**

විෂයක් සඳහා ලබාගත් ලකුණු පහත සඳහන් පරිදි දොළොස් විධි ක්‍රමයකට ශ්‍රේණිගත කරනු ලැබේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය | ශ්‍රේණි ලකුණු අගය |
|---|---|---|
| 85-100 | A+ | 4.00 |
| 70-84 | A | 4.00 |
| 65-69 | A- | 3.70 |
| 60-64 | B+ | 3.30 |
| 55-59 | B | 3.00 |
| 50-54 | B- | 2.70 |
| 45-49 | C+ | 2.30 |
| 40-44 | C | 2.00 |
| 35-39 | C- | 1.70 |
| 30-34 | D+ | 1.30 |
| 25-29 | D | 1.00 |
| 00-24 | E | 0.00 |

යම් ශිෂ්‍යයෙක් විසින් පාඨමාලාවට අදාළ සියලු ම විෂය ඒකක සම්පූර්ණ කළ යුතු වන අතර, එසේ කිරීමට අපොහොසත් වන විෂය ඒකක සම්බන්ධයෙන් පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකරයි නම් එකී විෂය ඒකක සඳහා E ශ්‍රේණියක් දෙනු ලැබේ.

**ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය ගණනය :-**

ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය යනු අධ්‍යයන සම්භාර අනුව බර තබන ලද ශ්‍රේණිගත ලකුණු අගයේ මධ්‍යයනය වේ.

උදාඃ අධ්‍යයන සම්භාර අනුව බර තබන ලද ශ්‍රේණිගත ලකුණු අගයන්හි එකතුව මුළු අධ්‍යයන සම්භාර ගණනින් බෙදීමෙන් **ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA)** නිර්ණය කරනු ලැබේ. දෙවන දශමස්ථානයට ශ්‍රේණිගතත ලකුණු සාමාන්‍යය ගණනය කරනු ලැබේ. උදාඃ ලෙස ශිෂ්‍යයකු විසින් අධ්‍යයන සම්භාර 05 බැගින් වූ විෂය ඒකක 05ක් හා අධ්‍යයන සම්භාර 02 බැගින් වූ විෂය ඒකක 2 ක් A,C,B+, D, C+ සහ B, A+ යන ශ්‍රේණි ලබාගත හොත්, ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA),

$$\frac{5 \text{ x } 4.0 + 5 \text{ x } 2.0 + 5 \text{ x } 3.3 + 5 \text{ x } 1.0 + 5 \text{ x } 2.3 + 2 \text{ x } 3.0 + 2 \text{ x } 4.0}{5 + 5 + 5 + 5 + 5 + 5}$$

$$= \frac{20.0 + 10.0 + 16.5 + 5.0 + 11.5 + 6.0 + 8.0}{29}$$

$$= \frac{77.0}{29} = 2.66$$

= 2.66 වේ. උපාධි ප්‍රදානය සඳහා ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA) ගණනය කිරීම සඳහා සියලු ම විෂය ඒකක (ELTU E1072- ව්‍යාපාර සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි හැර) සලකා බලනු ලැබේ.

# ප්‍රථම වසර

## BCOM E1015
## කළමනාකරණ මූලධර්ම

### අරමුණ

මෙම පාඨමාලා ඒකකය සකස් කොට ඇත්තේ ඒ තුළින් විද්‍යාර්ථීන්ට කළමනාකරණය හැඳින්වීම, එහි විකාශය හා ක්‍රියාවලිය පිළිබඳ ව පරිපූර්ණ දැනුමක් ලබාදීම සඳහාය.

### ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකයේ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පහත දැක්වෙන ඉගෙනුම් පල ළඟා කර ගැනීමට විද්‍යාර්ථීන් සමත් විය යුතු ය.

- කළමනාකරණය සහ එහි ක්‍රියාවලිය අර්ථදැක්වීම.
- විවිධ මට්ටමේ කළමනාකරුවන්ට අවශ්‍ය නිපුනතාවන් පැහැදිලි කිරීම.
- කළමනාකරණ චින්තනයේ විකාශය පැහැදිලි කිරීම.
- කළමනාකරණ ක්‍රියාවලිය පැහැදිලි කිරීම.
- සංවිධාන තුළ කළමනාකරණ මූලධර්ම යොදා ගන්නා ආකාරය ඇගයීම.
- කළමනාකරණයේ වර්තමාන නැඹුරුතා හා ගැටලු අවබෝධකර ගැනීම.

## පාඨමාලා අන්තර්ගතය

කළමනාකරණය හැඳින්වීම. අතීතයේ හා වර්තමානයේ කළමනාකරණය. සංවිධාන සංස්කෘතිය හා පරිසරය. සැලසුම්කරණය හා තීරණ ගැනීම. සැලසුම්කරණ ශිල්ප ක්‍රම හා උපකරණ. සංවිධානකරණය. මානව සම්පත් කළමනාකරණය. නායකකරණය. අභිප්‍රේරණය. සන්නිවේදනය හා පාලනය. සමාජීය වගකීම් හා අචාරධර්ම. වෙනස්වීම් සහ නවතාවන් කළමනාකරණය. වර්තමාන නැඹුරුතා හා කළමනාකරණ ගැටලු. කළමනාකරණය පිළිබඳ සිද්ධි අධ්‍යයනයන්.

## ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

## ඇගයීමේ ක්‍රමය

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

## නිර්දේශිත කියවීම්


1. Robbins and De Cenzo (2008), *Fundamentals of Management*, 6th ed. Prentice Hall.
2. Certo and Certo. (2006). *Modern Management*. 10th ed. Prentice Hall.
3. Robbins, S. P. and Coulter, *Management*. 9th ed. Prentice Hall.
4. Hannagan. (2008). *Management: Concepts & Practices*. 5th ed. Financial Times Press.
5. Stoner J.A.F. Freeman R.E., and Gilbert D.R. (1996). *Management.* 6th ed. Prentice Hall Inc, New Delhi,India.

# BCOM E1025
## සූක්ෂම ආර්ථික විද්‍යාව

## අරමුණ

මෙම පාඨමාලා ඒකකය හඳුන්වාදීමේ මූලික අභිමතාර්ථය වන්නේ සූක්ෂම ආර්ථික විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ මනා අවබෝධයක් ලබාදීම සහ පරිභෝගිකයන්ගේ සහ විවිධ වර්ගයෙහි ආයතනවල තනි ඒකක හැසිරීම් පිළිබඳ පුළුල් දැනුමක් ලබාදීමත්ය.

## ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී විද්‍යාර්ථීන්ඃ

- ආර්ථිකවිද්‍යා විද්‍යාඥයන් විසින් සංවර්ධනය කරන ලද ව්‍යාපාර ලෝකයට වැදගත් වන ආර්ථිකවිද්‍යා මූලධර්ම සහ විශ්ලේෂණ ක්‍රම හඳුනාගැනීමට
- තනි පුද්ගල පාරිභෝගිකයින්ගේ, සම්පත් හිමිකරුවන්ගේ සහ ව්‍යාපාර ආයතනවල ආර්ථික හැසිරීම හඳුනා ගැනීමට
- විවිධ වෙළඳපොළ ව්‍යුහයන්ගේ හැසිරිම හඳුනාගැනීමට
- විවිධ වෙළඳපොළ ව්‍යුහයක් යටතේ, මිළ හා නිමවුම තීරණය වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කිරීමට සමත් විය යුතු ය.

## පාඨමාලා අන්තර්ගතය

හැඳින්වීම. මිල තීරණය කිරීම; ඉල්ලුම, සැපයුම සහ වෙළඳපොළ සමතුලිතය. ඉල්ලුම ඇස්තමේන්තු කිරීම සහ ඉල්ලුම පුරෝකථනය. නම්‍යතා මිනුම්. පාරිභෝගික හැසිරීම පිළිබඳ න්‍යාය, ආන්තික උපයෝගිතා විග්‍රහය, උපේක්ෂා වක්‍ර විග්‍රහය. නිෂ්පාදන න්‍යාය; එක් විචල්‍යය යෙදවුමක් සමග නිෂ්පාදිතය, විචල්‍යය සාධක දෙකක් සමග නිෂ්පාදිතය. නිෂ්පාදන

පිරිවැය පිළිබඳ න්‍යාය. වෙළඳපොළ ව්‍යුහයන්; පූර්ණ තරඟය, ඒකාධිකාරය, ඒකාධිකාරී තරඟය සහ කතිපයාධිකාරය යටතේ මිල හා නිමවුම තීරණය කිරීම, ක්‍රීඩා න්‍යාය සහ කතිපයාධිකාරි හැසිරීම. පොදු සමතුලිතය සහ සුභසාධන ආර්ථික විද්‍යාව.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්**

1. Salvatore D. (2002) *Microeconomic Theory and Application.* 4th Edition. Oxford University press.
2. Salvatore D. (1994). *Microeconomics (Schaum's Outline Sereis)* 4th Edition. New York: McGraw Hill.
3. Dwivedi D.N. (2006). *Microeconomics Theory and Applications*. Person education.
4. Crystal K.A. and Lipsey R.G. (1997). *Economics for Business Management.* Oxford University Press.

# BCOM E1035
## මූල්‍ය ගිණුම්කරණය

**අරමුණ**

මෙම පාඨමාලා ඒකකය නිර්මාණය කර ඇත්තේ ගිණුම්කරණ පරිසරය, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වන සංකල්පනාත්මක රාමුව, තෝරාගත් ගිණුම්කරණ ප්‍රමිතීන්, ව්‍යාපාර සංවිධානවලට එම ප්‍රමිතීන්වල අදාළත්වය යනාදිය සම්බන්ධයෙන් විද්‍යාර්ථීන්ගේ දැනුම වර්ධනය කිරීම සහ, හවුල් ව්‍යාපාර විසුරුවා හැරීම, සංගත වීම සහ හවුල් ව්‍යාපාරය සමාගමකට පරිවර්තනය වීම සහ ශාඛා ගිණුම් සම්බන්ධයෙන් සම්පූර්ණ දැනුමක් හා අවබෝධයක් ලබා දීමටයි.

**ඉගෙනුම් පල**

මෙම පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්:

- ගිණුම්කරණ පරිසරය සහ සංකල්පනාත්මක රාමුව අවබෝධ කර ගැනීම.
- හවුල් ව්‍යාපාර විසුරුවා හැරිය හැකි විවිධ ක්‍රම විස්තර කිරීම.
- හවුල් ව්‍යාපාරයක් තනි පුද්ගල ව්‍යාපාරයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් ගිණුම් තැබීම.
- නව හවුල් ව්‍යාපාරයක් පිහිටුවීම සඳහා තනි පුද්ගල ව්‍යාපාර එකක් හෝ වැඩි ගණනක් හවුල් ව්‍යාපාර එකක් හෝ වැඩි ගණනක් සංගත වීම සම්බන්ධයෙන් ගිණුම් තැබීම.
- හවුල් ව්‍යාපාරයක් සමාගමකට පරිවර්තනය වීම සම්බන්ධයෙන් ගිණුම් තැබීම.

- මධ්‍යගත හා විමධ්‍යගත ක්‍රමය යටතේ ශාඛා ගිණුම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.
- අදාළ ප්‍රමිතීන්ට යොමු වෙමින් විවිධ ගිණුම් පැහැදිලි කිරීම සඳහා සමත් විය යුතු ය.

## පාඨමාලා අන්තර්ගතය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා ගිණුම්කරණ පරිසරය සහ සංකල්පනාත්මක රාමුව. හවුල් ව්‍යාපාර; හවුල් ව්‍යාපාර විසුරුවා හැරීම, දැනට පවතින හවුල් ව්‍යාපාරයක් මිලදී ගැනීම, හවුල් ව්‍යාපාර සංගත වීම, හවුල් ව්‍යාපාරයක් සමාගමකට පරිවර්තනය වීම. ශාඛා ගිණුම්; විමධ්‍යගත ක්‍රමය හා මධ්‍යගත ක්‍රමය. විවිධ ගිණුම්; කුලී පිට ගැණුම් ගිණුම්, ආයෝජන සඳහා ගිණුම්කරණය, බද්ධ ව්‍යාපාර ගිණුම්. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත; මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (ශ්‍රී.ල.ගි.ප්‍ර.01), තොග (ශ්‍රී.ල.ගි.ප්‍ර 02), ඉදිකිරීම් කොන්ත්‍රාත්තු (ශ්‍රී.ල.ගි.ප්‍ර 11), දේපළ, පිරියත හා උපකරණ (ශ්‍රී.ල.ගි.ප්‍ර 16), කල්බදු (ශ්‍රී.ල.ගි.ප්‍ර 17), ආදායම (ශ්‍රී.ල.ගි.ප්‍ර.18), ණය ගැණුම් පිරිවැය (ශ්‍රී.ල.ගි.ප්‍ර 23).

## ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

## ඇගයීමේ ක්‍රමය

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

## නිර්දේශිත කියවීම්


1. Frank wood, Alan Sangster. (2008). *Business Accounting 1* 11th Edition. Pitman Publication.
2. Maheshwari, S.N. Maheswari, S.K. (2004). *Advanced Accountancy vol: 01*. 9th revised Edition. India:Vikas Publishing,
3. Shukla M.C. Grewal .T.S. (2006). *Advanced Accounts Volume 1*,16 Edition. India: S. Chand & Company Ltd.
4. Sri Lanka Accounting Standards. (2011). Institute of Chartered Accountants of Sri Lanka.
5. *Sri Lanka Accounting Standards for Small & Medium Sized Entities (SLFRS for SME's)*. (2011). Institute of Chartered Accountants of Sri Lanka.


# BCOM E1045
## ව්‍යාපාර සඳහා ගණිතය

### අරමුණ

මෙම පාඨමාලා ඒකකය සැලසුම් කර තිබෙන්නේ ව්‍යාපාරික, මූල්‍ය හා ආයෝජන තීරණයන් ගැනීමේ දී හමු වන ගණිතමය ගැටලු අවබෝධ කරගැනීම, විශ්ලේෂණය හා විසඳා ගැනීම සඳහා අවශ්‍ය වන මූලික ගණිතමය හැකියාව සපයා දීමට ය.

### ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකය අවසානයේ විද්‍යාර්ථීන් පහත සඳහන් ඉගෙනුම් පල ලබා ගැනීමට සමත් විය යුතුය.

- ව්‍යාපාර තුළ ඇති වන ගැටලු විශ්ලේෂණය හා නිරාකරණය කර ගැනීමට අවශ්‍ය වන්නා වූ ගණිතමය ක්‍රම හා ශිල්ප ක්‍රම හඳුනා ගැනීම.
- කළමනාකරණ ශක්නුතාවට අවශ්‍ය වන මූලික ගණිතමයානුකූල ක්‍රම හා තව දුරටත් අවශ්‍ය වන උසස් ගණිතමයානූකූල ක්‍රම යොදා ගැනීම.

**පාඨමාලා අන්තර්ගතය :-**

ගණිතයේ එන මූලික සංකල්ප, ගණිතමය කර්ම, සාධක, දර්ශක, සමීකරණ; සර්වසම, කොන්දේසික, සරල, භාග, සමගාමී, වර්ග හා සමගාමී වර්ග සමීකරණ, සමීකරණ ආශ්‍රිත යෙදුම්. ශ්‍රිත; ඉල්ලුම්, සැපයුම් හා ආදායම් ශ්‍රිත, ලඝු ගණක, ද්විපද ප්‍රමේය. ශ්‍රේණි; සමාන්තර හා ගුණෝත්තර ශ්‍රේණි. විශ්ලේෂණ ජ්‍යාමිතිය; බෑවුම, අන්තඃඛණ්ඩය, සරල රේඛාවල හා සරල වක්‍රවල සමීකරණ. සංකරණ හා සංයෝජන කුලක හා එහි යෙදුම්. න්‍යාස. මූල්‍ය ගණිතය. කලනය; කලනයේ එන මූලික සිද්ධාන්ත, අවකලනය, ශ්‍රිතවල අවකලනය, අවකලනයේ භාවිතය, වර්තන ලක්ෂ්‍ය, උපරිම හා අවම ශ්‍රිත හා ප්‍රස්තාරී අනුකලනය; අනුකලන වර්ග, අනුකලනයේ නීති, නිශ්චිත අනුකලනයේ ලක්ෂණයන්, අනුකලනය හා එහි යෙදුම් ඇගයීම.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

## ඇගයීමේ ක්‍රමය

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

## නිර්දේශිත කියවීම්

1. Jerome F. Ernest. (2004). *Business Mathematics*. 5th Edition, Mc Graw-Hill.
2. Robert L. Dansby. (2000). *Business Mathematics Essentials*. Prentice Hall.
3. Andrew Kaplan, Carol Debold, Susan Rogalski, (2004). *A Mathematics Handbook*. 1st edition, Great Source Education Group.

# BCOM E1055
## ව්‍යාපාර හා කාර්මික නීතිය

## අරමුණ

ශ්‍රී ලංකාවේ ව්‍යාපර පරිසරය හා සම්බන්ධ නීති හා රේගුලාසි පිළිබඳ පුළුල් දැනුමක් සහ අවබොධයක් ලබාදීම සඳහා මෙම පාඨමාලා ඒකකය නිර්මාණය කර ඇත.

## ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී

- ව්‍යාපාරික සන්දර්භය තුළ නීතියෙහි භූමිකාව හඳුනාගැනීමට
- ශ්‍රී ලංකාවේ ව්‍යාපර ක්‍රියාකාරකම් හා සම්බන්ධ නිතීන් හඳුනාගැනීමට

- ප්‍රායෝගික ගැටලු නිරාකරණය කිරීමේ දී විවිධ රීති හා රේගුලාසි යොදා ගැනීමට සිසුන්ට හැකියාව ලැබෙනු ඇත.

**පාඨමාලා අන්තර්ගතය**

වයාපාර නීතිය 70%

නීතිය හැඳින්වීම, ගිවිසුම් නීතිය, නියෝජ්‍යයත්ව නීතිය, භාණ්ඩ විකිණීමේ නීතිය, කුලීපිට ගැනුම් නීතිය, ගණුදෙනු කළ හැකි ලියවිලිවලට අදාළ නීතිය, සමාගම් නීතිය, හවුල් ව්‍යාපාර නීතිය, රක්ෂණ නීතිය, බුද්ධිමය දේපල හා සම්බන්ධ නීතිය.

කාර්මික නීතිය

කාර්මික සම්බන්ධතා ඉතිහාසය, රැකියා ගිවිසුම්, සේවා නියුක්ති වර්ග, කාර්මික ආරවුල් පනත සාප්පු හා කාර්යාල සේවක පනත, පඩිපාලක සහ ආඥා පනත, පාරිතෝෂික ගෙවීම් පනත, සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවක නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනත, වෘත්තීය සමිති ආඥා පනත, සේවකයන්ගේ සේවය අවසන් කිරීමේ පනත, කාන්තාවන්, තරුණයන් හා ළමුන් සේවයෙහි යෙදවීමේ පනත සේවක වන්දි ආඥා පනත, කර්මාන්තශාලා ආඥා පනත.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්**


1. McKendrick Ewan (2003). *Law of Contract,* $5^{th}$ Edition. palgrove McMillan. Hampshire UK.
2. Varshney G.K (2003), *Elements of Business Laws*, S Chand & Co, Ram Nagar, New Delhi
3. Weeramanthry, C.G. (1999). *The Law of Contracts. Voulme 1* & II. Kailaswh Balani Pvt Ltd. NewDelhi: Lajpat Naagr.
4. Gogna, P.P.S. (1999). *A Text Book on Merchantile La*w. NewDelhi:S Chand & Co. Ram Nagar.
5. Pallewela, C. (1970). *Law of Contract*. Colombo: Lakehouse Publishes.
6. Gamage P.N. (2007). *Business Law*. Author Publication.
7. Abeysekara W.E.M. (1970). *Industrial Law & Adjudication*, Volume 1, 11, 111. Arasanprinters. Sri Lanka: Colombo 2.
8. De Silva, E.B.M. (2002). *What Every Employer Should Know*. Colombo: Mercantile Printers.
9. *Hand book.* (2006). Rajagiriya: Employer Federation of Ceylon.
10. Jayasinghe C. (2006). *Industrial Law*. Rajagiriya: Employer Federation of Ceylon.
11. Kariaywasm, U. (2002). *Labour Law & Procedure*. Dehiwala: Chandrakanthi Press Ltd,
12. Gamage, P.N. (2007). *Business Law & Industrial Law*. Author Publication.

# BCOM E1065
## විද්‍යුත් වාණිජ්‍යය සහ තොරතුරු තාක්ෂණය හැඳින්වීම

### අරමුණ

නවීන විද්‍යුත් ව්‍යාපාරික පරිසරය අවබෝධ කර ගැනීමටත් සංවිධානයක කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා නවීන ව්‍යාපාරික ලෝකයේ ව්‍යාපාරික තොරතුරු පද්ධති තුළ භාවිත කරන තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා මෙම පාඨමාලා ඒකකය සැලසුම් කර ඇත.

### ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකය අවසානයේ විද්‍යාර්ථීන්,

- පුද්ගලික පරිගණකවල උපාංග සහ ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට
- පරිගණක භාවිතයේ සහ සංවර්ධනයේ මූලික සංකල්ප අර්ථ දැක්වීම
- සංවිධානයක් තුළ විවිධ තොරතුරු පද්ධති අර්ථ දැක්වීමට
- විද්‍යුත් වාණිජ්‍යයේ මූලික සංකල්ප අර්ථ දැක්වීමට
- විවිධ විද්‍යුත් ව්‍යාපාරික ආකෘතීන් වෙන්කොට හඳුනා ගැනීමට සමත්විය යුතු ය.

### පාඨමාලා අන්තර්ගතය

තොරතුරු තාක්ෂණයේ මූලික සංකල්ප. අන්තර්ජාලය සහ විද්‍යුත් තැපැල. විද්‍යුත් වාණිජ්‍යයේ දළ විශ්ලේෂණය. විද්‍යුත් වාණිජ්‍යයේ ව්‍යාපාරික ආකෘතීන්. ව්‍යාපාරයන් තුළ වන තොරතුරු පද්ධති; තොරතුරු පද්ධති, සංවිධාන, කළමනාකරණය සහ උපායමාර්ග.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්**


1. Journal of Information, Information Technology, and Organizations (JIITO).
2. *Microsoft Office Home and Student 2007,* Microsoft Efraim Turban, Richard E. Potter, R. Kelly Rainer Jr., *Introduction to Information Technology*, (2004), John Wiley & Sons.
3. Laudon K.C. and Laudon J.P. *Management Information Systems: Managing the Digital Firm (9th Edition)* (2006). Prentice Hall, India.
4. Turban E., *Electronic Commerce: A Managerial Perspectives* (2006). Prentice Hall, India.

# ELTU E1072
## ව්‍යාපාර සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි

**අරමුණ**

මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වනුයේ විද්‍යාර්ථීන්ගේ සන්නිවේදන කුසලතා ඉහල නංවන අතරතුර ඔවුන් ගේ විශේෂිත වූ අධ්‍යයන ක්ෂේත්‍ර තුළ කටයුතු කිරීම සඳහා විද්‍යාර්ථීන් සූදානම් කිරීම ය. සන්නිවේදනයේ කථනය හා ලිඛිත යන අංග දෙක ම පිළිබඳ සමාන අවධාරණයක් දෙනු ලබයි.

**ඉගෙනුම් පල**

මෙම පාඨමාලා ඒකකය අවසානයේ විද්‍යාර්ථීන්:

- සංවාද ආරම්භ කිරීම : ඇමතීම, ආරම්භය, කෙටි සංවාද, දිශාවන් ඇසීම හා ලබාදීම.
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් දුරකථන සංවාද හසුරුවාලීම, ඇමතුම් ආරම්භ කිරීම, පිළිතුරු දීම, දුරකථනය හරහා තොරතුරු ඇසීම හා ලබා දීම
- අදාළ පරිදි ආචාරසම්පන්න ලෙස අංග දැක්වීම.
- දේශන සඳහා සවන්දීම හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සටහන් කරගැනීම.
- එලදායී ඉදිරිපත් කිරීම්, ඉංග්‍රීසි නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
- ලෝක ව්‍යාපාරවලට අදාළ ශබ්දමාලාව භාවිත කිරීම.
- ලිඛිත හා වාචික දෑ සාරාංශගතව ඉදිරිපත් කිරීම.
- විෂයානුබද්ධ කරුණු කියවීම හා තේරුම් ගැනීම.
- වචන උච්චාරණය පිළිබඳ පොදු වැරදි හඳුනාගැනීම හා ඉන් මගහැරීම සමත්විය යුතු ය.

## පාඨමාලා අන්තර්ගතය

දෙබස්, කෙටි කථනය, සමාජ ප්‍රලාප, ශාස්ත්‍රීය ලිවීම පිළිබඳ හැඳින්වීම, ඉදිරිපත් කිරීමේ කුසලතා, සටහන් තබාගැනීමේ කුසලතා, නිර්දේශ ගොඩනැගීම, ශබ්දකෝෂය භාවිත කරන්නේ කෙසේද, විද්‍යාර්ථීන්ගේ අදාළ විෂය කරුණු කියවීම. පත්තර, සඟරා වැනි විශ්වාස කටයුතු කියවීම් දෑ. DELT අධ්‍යයන අංශය මගින් ගොනුකරනු ලැබූ මහජන විෂයපථය කරුණු වලට සවන්දීම.

## ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

## ඇගයීමේ ක්‍රමය

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

## නිර්දේශිත කියවීම්

1. Alexander, R. & Jones, L. (2003). *New International Business English*, Cambridge: Cambridge University Press.
2. Folse, K.S. Mahnke, M.K. Solomon, E.V. Williams, L. (2003). *Blueprints 1:Composition Skills for Academic Writing,*
3. Lefevre. C.A. & Lefevre, H.E. (1978). *Reading Power and Study Skills for College Work.* New York: Harcourt Brace Jovanovich, Inc.

4. Mascull, B. (2002). *Business Vocabulary in Use*. Cambride University Press.
5. Murphy, R. (1992). *Essential English Grammar.* Cambridge University Press, Cambridge. Houghton Mifflin Company, New York.

# දෙවන වසර

## BCOM E2015
## අලෙවි කළමනාකරණය

**අරමුණ**

මෙම පාඨමාලා ඒකකය මගින් විද්‍යාර්ථීන්ට අලෙවි කළමනාකරණයේ මූලිකාංග, අලෙවි මිශ්‍රය, පාරිභෝගික හැසිරීමට අදාළ සංකල්පයන් සහ අලෙවිකරණ සැලැස්ම පිළියෙල කිරීමට අදාළ දැනුම ලබාදීම අරමුණු කරගෙන තිබේ.

**ඉගෙනුම් පල**

මෙම පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට පහත ප්‍රතිඵල ලබාගැනීමට හැකියාව ලැබේ.

- අලෙවිකරණය සහ එහි මූලික සංකල්පයන් නිර්වචනය කිරීම.
- වටිනාකම් ප්‍රස්තුතය විස්තර කිරීම.
- වෙළඳපොළ ඛණ්ඩනය, ඉලක්කගත කිරීම සහ ස්ථානගත කිරීම යන සංකල්ප පැහැදිලි කිරීම.
- අලෙවි මිශ්‍රයට අදාළ අංග විස්තර කිරීම.
- පාරිභෝගික හැසිරීමට අදාළ සංකල්පයන් පැහැදිලි කිරීම.
- අලෙවිකරණ සැලැස්ම පිළියෙල කිරීම.

## පාඨමාලා අන්තර්ගතය

අලෙවිකරණය හැඳින්වීම, අලෙවිකරණයේ මූලික සංකල්ප, අලෙවිකරණ අනුගතකිරීම, පාරිභෝගික වටිනාකම් දර්ශවාදය, වටිනාකම් දාම විශ්ලේෂණය. අලෙවිකරණ පරිසරය. අලෙවිකරණ තොරතුරු පද්ධතිය. අලෙවිකරණ පර්යේෂණ. වෙළඳපොල ඛණ්ඩනය. ඉලක්කගත කිරීම සහ ස්ථානගත කිරීම. නිෂ්පාදිතය. සේවා අලෙවිකරණය. මිල උපායමාර්ග. බෙදාහැරීම. අලෙවිකරණ සන්නිවේදනය. පාරිභෝගික හැසිරීමේ මූලිකාංග. අලෙවිකරණ උපක්‍රම සහ අලෙවිකරණ සැලැස්ම.

## ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

## ඇගයීමේ ක්‍රමය

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

## නිර්දේශිත කියවීම්

1. Kotler, P, & Keller K. L. (2006). *Marketing Management*. 12th ed., Prentice Hall.
2. Kotler, P & Armstrong G. (2007). *Framework for Marketing Management. 3rd* ed. Prentice Hall.
3. Armstrong G. (2007). *Principles of Marketing.* 12th ed. Prentice Hall.

4. Kotler P. (2002). *Marketing Management*. 11th ed., Prentice Hall.
5. Wilson Richard, M.S. and Gilligon C. (2005). *Strategic Marketing Management*: *Planning, Implementation and Control*. 3rd ed., Prentice Hall.

# BCOM E2025
## මානව සම්පත් කළමනාකරණය

**අරමුණ**

වර්තමාන සංවිධානය තුළ යථාර්තයන් වටහා ගැනීමත්, සංවිධානයක් තුළ පුද්ගල සහ කණ්ඩායම් හැසිරීමට බලපාන සංවිධාන චර්යාවෙහි ගැටලු හා මූලික අදහස් පිළිබඳ විද්‍යාර්ථීන් දැනුවත් කිරීමත්, මෙම පාඨමාලා ඒකකයෙන් බලාපොරොත්තු වේ.

**ඉගෙනුම් පල**

මෙම පාඨමාලා ඒකකයේ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පහත දක්වෙන ඉගෙනුම් පල ලබාගෙන සිටීමට විද්‍යාර්ථීන්න් සමත්විය යුතු ය.

- සංවිධාන චර්යාවන්ට අදාළ සංකල්පයන් නිර්වචනය කිරීම.
- සංවිධාන චර්යාවන්ට අදාළ න්‍යායන් සහ සංකල්පයන් අවබෝධ කර ගැනීම.
- සංවිධානයන් තුළ දැනට භාවිත වන සංවිධාන චර්යාවන්ට අදාළ න්‍යාය සහ සංකල්ප ඇගයුම් කිරීම.

## පාඨමාලා අන්තර්ගතය

හැඳින්වීම. - පුද්ගල චර්යාවන් පදනම් වූ ආකල්ප. සංජානනය. පෞරුෂත්වය. පුද්ගල වෙනස්කම් නිසා ඇකියා වර්ධනය. කාර්ය පරිසරය තුළ අභිප්‍රේරණය. ඵලදායී තීරණ ගැනීම. සමූහ හා කණ්ඩායම්. කණ්ඩායම් ගතිකත්වය, වැඩ කණ්ඩායම් සන්නිවේදනය. බලය හා සංවිධානික දේශපාලනය බලගැන්වීම. ආතතිය හා ගැටුම්. ගිවිස ගැනීම හා අන්තර් කණ්ඩායම් චර්යා.

## ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

## ඇගයීමේ ක්‍රමය

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

## නිර්දේශිත කියවීම් :-


1. Luthans, F. (2008). *Organizational Behaviour*, 11th ed. Mc Graw Hill.
2. Robbins, S. P. (2006). *Organizational Behaviour*. 12th ed. Prentice hall.
3. Paul H. Hersey, Kenneth H. Blenchard & Dewey E. Johnson. (2008). *Management of Organizational Behavior*. 9th ed. Prentice Hall.
4. Stephen P. Robbins, and Tim Judge. (2008). *Essentials of Organizational Behavior*. 9th ed. Prentice Hall.

# BCOM E2035
## ව්‍යාපාර සංඛ්‍යානය

### අරමුණ

මෙම පාඨමාලා ඒකකය නිර්මාණය කර ඇත්තේ විවිධ ව්‍යාපාර භාවිතයන් / යෙදවුම්වල දී සංඛ්‍යාන ශිල්ප ක්‍රමයන් භාවිත කිරීමට සහ අර්ථ දැක්වීමට අවශ්‍ය වන දැනුම හා කුසලතා සලසා දීමටයි.

### ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් නිපුනතාවන්ට ළඟා විය හැකි විය යුතු ය.

- ව්‍යාපාර හා සම්බන්ධ දත්ත රැස් කිරීමේ දී, විශ්ලේෂණය කිරීමේ දී සහ අර්ථකථනය කිරීමේ දි සංඛ්‍යානය මෙවලමක් ලෙසින් භාවිත කළ හැකිවීම.
- චර්යාත්මක සහ ව්‍යාපාරික තත්ත්වයන් නියම වශයෙන් සඳහන් කිරීම සඳහා සංඛ්‍යාන ශිල්ප ක්‍රමයන් යොදා ගත හැකි වීම.

### පාඨමාලා අන්තර්ගතය

ව්‍යාපාර සංඛ්‍යානය හැඳින්වීම. නිර්වචනය සහ විෂය ක්ෂේත්‍රය, විස්තරාත්මක සංඛ්‍යානය. සම්භාවිතාවය සහ සම්භාවිත ව්‍යාප්ති. සංඛ්‍යාන අනුමිතිය හැඳින්වීම; නිමානය, කල්පිත පරීක්ෂාව, නියැදීම සහ නියැදුම් ව්‍යාප්ති. ප්‍රතිපායන විශ්ලේෂණය, කාලශ්‍රේණි විශ්ලේෂණය, පර්යේෂණ මෝස්තර නිර්මාණ ක්‍රම සහ විචලතා විශ්ලේෂණය. පරාමිතික නොවන සංඛ්‍යාන ක්‍රම, තත්ත්ව සංවර්ධනය හැඳින්වීම, පාලන සටහන් භාවිතයෙන් ක්‍රියාවලි සංවර්ධනය.

## ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

## ඇගයීමේ ක්‍රමය

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

## නිර්දේශිත කියවීම්


1. Beri G. C. (2007). *Business Statistics*, 2nd Edition. New Delhi: Tata McGraw- Hill.
2. David R. Anderson, Dennis J. Sweeney, and Thomas A. Williams, (2004). *Essential of Modern Business Statistics with Microsoft Excel*, South Western college Publishing, Mason OH.
3. David Moore, George Mc Cabe, and Williiam Duckwort (2003). *The Practice of Business Statistics, using Data for Decisions*, W.H. Free man & Company.
4. Mario F. Triola. (2007). *Elementary Statistics*, 10th edition. Wesley.

# BCOM E2045
## පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය

### අරමුණ

මෙම පාඨමාලා ඒකකය නිර්මාණය කර ඇත්තේ පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ මූලධර්ම සහ ශිල්පක්‍රම පිළිබඳ දැනුම සහ පුහුණුවක් ලබා දීමටත්, එම ශිල්පක්‍රම ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීම සඳහා යොදා ගැනීමටත් ය.

### ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකය අවසානයේ විද්‍යාර්ථීන්:

- පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ මූලධර්ම, සංකල්ප සහ ශිල්පක්‍රම හඳුනාගැනීම.
- පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ මූලධර්ම සහ ශිල්ප ක්‍රම භාවිතය.
- ලෝකයේ පවත්නා ප්‍රායෝගික ගැටලු විශ්ලේෂණය කිරීම සහ ඒවා සඳහා යෝග්‍ය ශිල්පක්‍රම යොදා ගනිමින් විසඳුම් යෝජනා කිරීම.

### පාඨමාලා අන්තර්ගතය

පිරිවැය ගිණුම්කරණය; පිරිවැය ගිණුම්කරණය හැඳින්වීම. අන්තර්ග්‍රහණය සහ ආන්තික පිරිවැයකරණය. තොග පාලනය, වැඩ සහ සමූහ පිරිවැය කරණය. අඛියර පිරිවැයකරණය. සේවා/ මෙහෙයුම පිරිවැයකරණය. පොදු ලාභ පරිමා විශ්ලේෂණය. පිරිවැය කළමනාකරණය සහ තීරණ ගැනීම. පාරිභෝගික ලාභදායීත්ව විශ්ලේෂණය.

කළමනාකරණ ගිණුම්කරණය; හැඳින්වීම. අයවැය සහ අයවැය පාලන ක්‍රම. මිල ක්‍රම සහ මාරු මිල ක්‍රමය. පූර්ව කථනය. ප්‍රමිත පිරිවැයකරණය සහ විචලනයන් විශ්ලේෂණය. කාර්ය සාධනය ඇගයීම. ක්‍රියාකාරකම් මූල පිරිවැයකරණය. පූර්ණ තත්ත්ව කළමනාකරණය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්**


1. Colin Drury, (2004). *Management and Cost Accounting,* 6th Edition. London: International Thomson Business Press.
2. Kaplan & Atkinson, Advanced *Management Accountancy*. (2005). New Delhi: Prentice Hall.
3. Horngren C.T. Foster G. Datar S.M. (2006). *Cost Accounting: A Managerial Emphasis*, 12th Edition. Prentice Hall of India, New Delhi.

# BCOM E2055
# සාර්ව ආර්ථික විද්‍යාව

**අරමුණ**

මෙම පාඨමාලා ඒකකය හඳුන්වාදීමේ මූලික අරමුණ වන්නේ සමාහාර /සාර්ව ආර්ථික සංකල්ප පිළිබඳ දැනුමක් ලබාදීම සහ ශ්‍රී ලංකාවට එහි භාවිතයන් අදාළ කරවීම.

**ඉගෙනුම් පල**

මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී විද්‍යාර්ථීන්ට පහත හැකියාවන් වර්ධනය කරගැනීමට අවස්ථාව ලැබේ.

- ප්‍රධාන සාර්ව ආර්ථිකවිද්‍යා විචල්‍යයන්ට අදාළ වන න්‍යායන් සහ සංකල්ප විස්තර කිරීම.
- ආර්ථිකයක ජාතික ආදායම් තීරණය කරන ප්‍රධාන සාධක, ආදායම් වර්ධනය සහ පොදු මිල මට්ටම් භාවිතය
- නූතන සාර්ව ආර්ථිකවිද්‍යා ප්‍රතිපත්ති සහ ප්‍රායෝගිකයන්ගේ සමාහාර හැසිරීම අගය කිරීම.

**පාඨමාලා අන්තර්ගතය :-**

හැඳින්වීම. කේන්සියානු ආදායම් - වියදම් ආකෘතිය. IS-LM විග්‍රහයට අනුව සමතුලිත ජාතික ආදායම තීරණය කිරීම. පාරිභෝජන, ඉතුරුම් හා ආයෝජන පිළිබඳ න්‍යායන්. මූල්‍ය සහ අයවැය ප්‍රතිපත්ති. උද්ධමනය සහ සේවා වියුක්තිය. තාර්කික අපේක්ෂාව. ස්ථායීකරණ ප්‍රතිපත්ති. ව්‍යාපාර චක්‍ර. සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳ විවාදයන්. විවෘත ආර්ථික. ආර්ථික අවපාත හා ද්වීපාතයන්.

### ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

### ඇගයීමේ ක්‍රමය

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

### නිර්දේශිත කියවීම්


1. Eugene A. Diulio. (1998). *Macroeconomics (Schaum's Outline Sereis).* 3rd Edition. McGraw Hill.
2. Dwivedi, D.N. (2004). *Macroeconomics: Theory and Policy*.International Edition, McGraw Hill.
3. Rudiger Dornbuch, Stanley Fisher, (2006). *Macroeconomics,* 8th Edition (International Edition). McGraw-Hill, Inc.
4. Central Bank Annual Report.
5. Recent Economic Development – Highlights.

# BCOM E2065
## සංකාර්යය කළමනාකරණය

### අරමුණ
මෙම පාඨමාලා ඒකකය සංකාර්යය කළමනාකරණය හා සම්බන්ධ කාර්යයන් හා ක්‍රියාවලින් පිළිබඳ සමස්ත දැනුම ලබා දීම සඳහා නිර්මාණය කර ඇත.

### ඉගෙනුම් පල
මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී විද්‍යාර්ථීන්

- සංකාර්යය කළමනාකරණය හා එහි ක්‍රියාවලිය විග්‍රහ කිරීම
- සංකාර්යය කළමනාකරණය හා සංවිධාන උපායමාර්ග අතර සම්බන්ධය යෝජනා කිරීම
- සංකාර්යය කළමනාකරණ ක්‍රම සංවිධාන ක්‍රියාවලිය සඳහා යොදා ගැනීම අපේක්ෂා කෙරේ.

### පාඨමාලා අන්තර්ගතය
සංකාර්යය කළමනාකරණය හැඳින්වීම, සංකාර්යය උපක්‍රම, භාණ්ඩ හා සේවා, ක්‍රියාවලි සැලසුම්කරණය, පහසුකම්, ස්ථානය හා පිරියත, සැපයුම් දාම කළමනාකරණය, ධාරිතා හා සමාහාර සැලසුම්කරණය, ලේඛනගත කිරීම තොග කළමනාකරණය, ගුණත්ව හා සංඛ්‍යාන ක්‍රියාවලි පාලනය, පොරොත්තු න්‍යාය, නඩත්තු කළමනාකරණය, සංකාර්යය කළමනාකරණය සඳහා ආයතනික සම්පත් සැලසුම්කරණය, සංකාර්යය කළමනාකරණය සඳහා තාක්ෂණය භාවිතය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්**


1. Lee J. Krajewski, Larry P Ritzman, and Manoj K. Malhotra. (2006). *Operations Management: Processes and Value Chains*.8th edition. Prentice Hall, India.
2. Jay Heizer, and Barry Render. (2007). *Principles of Operations Management*. 7th ed. Pearson Education.
3. Russel R.S. Tayllor III B.W. (2004). *Operations Management*, India: Prentice Hall.
4. Chase, Jacobs, Aquilano. (2006). Operations Management for Competitive Advantage with Global Casses, McGraw-hill

# තෙවන වසර

## BCOM E3015
## මානව සම්පත් කළමනාකරණය

### අරමුණ

මෙම පාඨමාලා ඒකකය, න්‍යායාත්මක පදනම මත මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පෘථුල දැනුමක් ලබාදීමට සහ උපායශීලී මානව සම්පත් කළමනාකරණය අනුගමනය කරමින් සංවිධානමය කාර්ය සාධනය සිදු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව සැලසුම් කර ඇත.

### ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකය හැදෑරීමෙන් පසු විද්‍යාර්ථීන් ට පහත ප්‍රතිඵල ලබාගැනීමට හැකියාව ලැබේ.

- මානව සම්පත් කළමනාකරණය හා එහි වටිනාකම විස්තර කිරීම.
- මානව සම්පත් කළමනාකරණ සංකල්ප සහ විෂය රාමුව විස්තර කිරීම.
- මානව සම්පත් උපයා මාර්ග සහ ආයතන කාර්ය සාධනය විභාග කිරීම.
- මානව සම්පත් කළමනාකරුගේ මූලිකාංග හා බැඳුන කුසලතාවන් සඳහා මග පෙන්වීම.

### පාඨමාලා අන්තර්ගතය

මානව සම්පත් කළමනාකරණය හැඳින්වීම සහ ඇගයීම. මානව සම්පත් කළමනාකරණය සංකල්පනාත්මක රාමුව හා ආකෘතිය. මානව සම්පත්

කළමනාකරුගේ භූමිකාව හා ශ්‍රිතයන්. මානව සම්පත් කළමනාකරණයේ නව ප්‍රවණතාවන්. මානව සම්පත් සැලසුම්කරණය. සේවකයන් තෝරාගැනීම හා බඳවා ගැනීම. මානවසම්පත් පුහුණුව සහ සංවර්ධනය. මානව සම්පත් කාර්යසාධනය සේවකයන්ගේ වැටුප් හා දීමනා කළමනාකරණය. සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව. කාර්මික සම්බන්ධතා. මානව සම්පත් දෙපාර්තමේන්තු හා පද්ධතිය. මානව සම්පත් කළමනාකරණ උපාය මාර්ග හා ව්‍යාපාර කාර්යසාධනය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්**


1. Dessler, G. (2008). *Human Resource Management*. 11th ed.Prentice Hall.
2. Dessler, G. (2006). *A Framework for Human Resource Management*. 4th ed. Prentice Hall.
3. Decenzo D. A. (2006). *Human Resource Management*.
4. Ivanecivich, J. M. (2006). *Human Resource Management*.
5. Mondy. (2008). *Human Resource Management*. 10th ed. Prentice Hall.
6. Ulrich, D. *Human Resource Champions: The Next Agenda for Adding Value and Delivering Results.* Boston, MA: Harvard Business School Press, 1997.

# BCOM E3025
## ව්‍යවසායකත්වය

### අරමුණ

මෙම පාඨමාලා ඒකකයෙන් බලාපොරොත්තු වන්නේ, විද්‍යාර්ථීන්ගේ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීමටත්, ඔවුන්ට වෘත්තීය ව්‍යවසායකයන් ලෙස හෝ නව්‍යකරණ විධායකවරයෙකු ලෙස ආයතන වල සේවය කිරීමටත්, ඒ මගින් ආයතන හෝ ආයතන කොටස් පාලනය කිරීමට අවශ්‍ය දැනුම ලබාදීමකි.

### ඉගෙනුම් පල

මෙම පාඨමාලා ඒකකයේ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පහත දැක්වෙන ඉගෙනුම් පල ලබාගැනීමට විද්‍යාර්ථීන් සමන්විත විය යුතු ය.

- සංස්ථාපනය වූ ආයතන නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය ඔවුන් තුළින් ම නව්‍යකරණයට ලක්කරන්නේ කෙසේ ද යන්න විචාරාත්මකව සොයා බැලීම.
- නව ව්‍යාපාර තුළ නියමයන් නොමැති දෑ සාර්ථකත්වය කරා ළඟා කරගැනීමට.
- ස්ථිර ව්‍යවසායකත්ව ක්‍රියාවන් සඳහා උත්පාදන, නවෝත්පාදනය හා සංස්ථාවක උපාය මාර්ගයන්ගේ වැදගත්කම අගය කිරීම.

### පාඨමාලා අන්තර්ගතය

ව්‍යවසායකත්වයේ ස්වභාවය හා නිර්වචන. ව්‍යවසායකත්වයේ වැදගත්කම. ව්‍යවසායකත්වයේ විකාශය. ව්‍යවසායකත්ව අවස්ථා. අවස්ථා හඳුනාගැනීම. අවස්ථා උපයෝජනය. ව්‍යවසායකත්ව

අභිප්‍රේරණය. සංස්ථානික ව්‍යවසායකත්වය හැඳින්වීම. උපායමාර්ගික පිළිසකරණය. උත්පාදක. නව්‍යකරණය. ව්‍යවසායකත්ව වර්ධනය. ව්‍යවසායකත්ව සංස්ථානය.

